අධ්‍යාපන අමාත්‍යාංශය

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය - 2020/2021

ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07

2021 වර්ෂය සඳහා අත්පිටපත් 2020 ඔක්.01 දින සිට 2020 දෙසැ. 31 දින දක්වා (රජයේ නිවාඩු දින හැර) පෙ.ව.9.00 - ප.ව. 3.00 කාලය තුළ භාර ගනු ලැබේ.


**ලිපි හා විමසීම්** - අධ්‍යක්ෂ ජනරාල්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අංක 14, නිදහස් මාවත

කොළඹ 07

දුරකථන අංක : 011 2687583

011 2698847 දිගුව 261 හෝ 248

විද්‍යුත් තැපැල : pub@mail.natlib.lk

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## **ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ආධුනික හා ප්‍රවීණ ලේඛකයන්ගේ ලේඛන අභිවෘද්ධිය නගාසිටුවීමේ අරමුණින් මෙහෙයවන ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය, 1984 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන ජාතික ව්‍යාපෘතියකි.

### 1. අරමුණු

i. ගුණාත්මක බවින් යුත් දේශීය ග්‍රන්ථ සුලබ කිරීම
ii. පොතපත කියවීම ප්‍රවර්ධනය කිරීම
iii. ග්‍රන්ථ කර්තෘවරුන් හා පරිවර්තකයන් දිරිමත් කිරීම
iv. ප්‍රකාශනවල නිෂ්පාදන ප්‍රමිතිය හා ගුණාත්මකභාවය උසස් තලයකට ගෙන ඒම
v. ප්‍රකාශනවල මිල සාධාරණ මට්ටමක පවත්වා ගෙන යාම
vi. ජාතික පුස්තකාල සේවාව සංවර්ධනය කිරීම

### 2. ඉදිරිපත් කළ හැකි අත්පිටපත්

පහත සඳහන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අත්පිටපත් ඉදිරිපත් කිරීමට අවස්ථාව හිමිවේ.

i. ශාස්ත්‍රීය / පර්යේෂණ කෘති
ii. විෂයානුබද්ධ / පරිවර්තන කෘති
iii. නිර්මාණාත්මක කෘති (නවකතා / කෙටිකතා / පද්‍ය / නාට්‍ය / ගීත)

### 3. ඉදිරිපත් කළ නොහැකි අත්පිටපත්

පහත සඳහන් කාණ්ඩවලට අයත් අත්පිටපත් මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කළ නොහැකිය.

**i.** මීට පෙර මුද්‍රණයෙන් ප්‍රකාශිත කෘති
**ii.** විභාග නිර්දේශවලට අනුව ලියූ උපකාරක කෘති හෝ විභාග ඉලක්ක කොට ප්‍රශ්නෝත්තර ස්වරූපයෙන් ලියන ලද අත්පිටපත්
**iii.** යුනෙස්කෝ නිර්ණායකයන්ට අනුව, මුද්‍රණය කළ පසු පිටු **49** ට අඩු විය හැකි අත්පිටපත්
**iv.** ප්‍රමාණවත් පෙළක් රහිත චිත්‍ර, මෝස්තර හා ඡායාරූප අඩංගු ප්‍රකාශන
**v.** චිත්‍ර කතා පොත්
**vi.** ග්‍රන්ථ ස්වරූපයෙන් සංස්කරණය නොකරන ලද උපාධි නිබන්ධන
**vii.** වෙනත් ආධාර ව්‍යාපෘතියක් සඳහා ඉදිරිපත් කරන ලද අත්පිටපත්
**viii.** මීට පෙර ඉදිරිපත් කර ප්‍රතික්ෂේප වූ අත්පිටපත්
**ix.** මෙම ව්‍යාපෘතිය යටතේ **මීට පෙර අවස්ථා 3 කදී මුද්‍රණාධාර ලැබූ** ලේඛකයන් රචිත අත්පිටපත්

## 4 . ආධාර පටිපාටිය

සැලකිය යුතු උසස් මට්ටමක ඇති අත්පිටපත්වල ගුණාත්මක බව තවදුරටත් වර්ධනය කිරීමට උපදෙස් දීම මෙන්ම උසස් මුද්‍රණ හා ප්‍රකාශන ප්‍රමිති හඳුන්වා දී අනුමත අත්පිටපත් මුද්‍රණය කළ පසු ඉන් පිටපත් සංඛ්‍යාවක් මිලදී ගැනීම මගින් මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ලේඛකයාට ආධාර කරයි. ආධාර මුදලේ උපරිමය අත්පිටපත අදාළ කාණ්ඩය අනුව වෙනස් වේ.

**සැ.යු.** කෘතියේ අන්තර්ගතයේ ගුණාත්මක වටිනාකම සහ මුද්‍රණ වියදම සලකා බලා ගෙවිය යුතු ආධාර මුදල කමිටුවක් විසින් නිශ්චය කරනු ලැබේ. ආධාර අනුමත වූ කෘතියකින් අවම වශයෙන් පිටපත් 1000ක් ප්‍රකාශයට පත් කළ යුතු වේ. හැකි සෑම අවස්ථාවකම ඊට වැඩි පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කොට බෙදාහැරීමෙන් දේශීය පාඨකයාට හා පුස්තකාලවලට සහායවීම ද, පිටපතක මිල සාධාරණ මට්ටමක පවත්වා ගෙන යාම ද, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය බලාපොරොත්තු වේ.

මේ අනුව මණ්ඩලයීය මුද්‍රණ උපදේශක කමිටුව මගින් තීරණය කරනු ලබන මුදලට සරිලන මුද්‍රිත පිටපත් සංඛ්‍යාවක් මිල දී ගැනීමෙන් මණ්ඩලය ලේඛකයාට ආධාර කරනු ඇත.

## 5. අත්පිටපත් සකස් කිරීම

i. අදාළ අත්පිටපතෙහි අන්තර්ගතයෙහි කිසිදු ආගමකට, ජාතියකට, ජනකොට්ඨාසයකට, ආයතනයකට හෝ පුද්ගල නාමයකට ඍජුව හෝ වක්‍රව දෝෂ දර්ශනයට ලක්විය හැකි කරුණු අන්තර්ගත නොවිය යුතුය.

ii. අත්පිටපත තනි පිටුවේ හෝ දෙපැත්තේ පැහැදිලිවත්, නිවැරදිවත් පරිගණක අක්ෂර සංයෝජනය කොට හෝ යතුරු ලියනය කළ යුතුය. රහස්‍යභාවය රැකගැනීම පිණිස පරිගණක අක්ෂර සංයෝජනය හෝ යතුරු ලියනය කරන ලද අත්පිටපතක් ලබා දීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍යය.

iii. සමීක්ෂකවරයාට සිය නිරීක්ෂණ පහසුවෙන් සටහන් කළ හැකි වන ආකාරයට කොළයේ වම් කෙළවරේ සහ පේළි අතර සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් තිබිය යුතුය.

iv. මුද්‍රිත කෘතියට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන චිත්‍ර, ඡායාරූප, සංඛ්‍යාලේඛන, ග්‍රන්ථනාමාවලිය, අනුක්‍රමණිකා, පටුන ආදිය අත්පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය. පිළිගැන්වීම, හැඳින්වීම, පෙරවදන, පසුවදන, උපකාරානුස්මෘති සහ පිටකවරය ඇතුළු සියලු කොටස් ගිවිසුම් අත්සන් කළ පසු ඉදිරිපත් කළ යුතුය.

v. අත්පිටපත විධිමත්ව හා මනාව බැඳ ඉදිරිපත් කළ යුතුය.

vi. අත්පිටපතේ කර්තෘගේ නම හෝ කර්තෘ හඳුනාගත හැකි වෙනත් කිසිදු සලකුණක් අන්තර්ගතව නොතිබීම හා නිවැරදිව පිටු අංකනය කර තිබිය යුතුය.

vii. අත්පිටපත් ඉදිරිපත් කිරීමට පෙර එහි භාෂාව මැනවින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය. එබඳු දෝෂ සහිත අත්පිටපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත සඳහන් ආකාරයට විධිමත්ව සකස් නොකොට ඉදිරිපත් කරන අත්පිටපත් සමීක්ෂණය සඳහා භාරගනු නොලැබේ.

## 6. අයදුම් කිරීම හා අත්පිටපත් ඉදිරිපත් කිරීම

i. ශාස්ත්‍රීය හෝ සාහිත්‍යමය වටිනාකමකින් යුත් අත්පිටපත්වලට පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ ආධාර දෙනු ලැබේ. ඒ සඳහා යෝග්‍ය /අයෝග්‍යතාව සලකා බැලීම පිණිස අදාළ අයදුම්පත නිසි පරිදි පුරවා, කෘතියේ පිටපත් දෙකක් හා සමීක්ෂණ ගාස්තුවද සමඟ ඉදිරිපත් කළ යුතු වේ. (අයදුම්පත් ගාස්තුව රු.150.00කි.)

ii. පරිවර්තන කෘතියක් පළ කිරීමේදී මතුවන නීතිමය ගැටලු ඇතොත්, ඒවා විසඳාගැනීම කතුවරයාගේ/ පරිවර්තකගේ /ප්‍රකාශකගේ වගකීම වේ. ( අදාළ අවසර ගැනීම් ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.)

iii. ලේඛකයකුට, වර්ෂයක් තුළදී ඉදිරිපත් කළ හැක්කේ එක් අත්පිටපතක් පමණි.

## 7. මූලික පරීක්ෂණය

අදාළ අත්පිටපත් පිළිබඳ මූලික පරීක්ෂණය, මණ්ඩලයේ ප්‍රකාශන උපදේශක කමිටුව විසින් සිදු කරනු ලබන අතර, එහිදී ව්‍යාපෘතියට ඇතුළත් කර ගැනීමට මූලික අනුමැතිය ලද අත්පිටපත් පමණක් සමීක්ෂණය සඳහා භාර ගනු ලැබේ. ප්‍රකාශන උපදේශක කමිටුව විසින් මූලික පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කරනු ලබන අත්පිටපත් අදාළ සමීක්ෂණ ගාස්තුව ද සමඟ ලේඛකයා වෙත ආපසු යොමු කරනු ලැබේ.

## 8. සමීක්ෂණ ගාස්තු

i. ශාස්ත්‍රීය / පර්යේෂණ අත්පිටපත් සමීක්ෂණය

| | |
|---|---|
| පිටු 1 – 150 දක්වා | රු. 2000.00 |
| පිටු 150ට වැඩි වන සෑම පිටුවකටම | රු. 10.00 |

ii. පරිවර්තන අත්පිටපත් සමීක්ෂණය

| | |
|---|---|
| පිටු 1 – 150 දක්වා | රු. 1500.00 |
| පිටු 150ට වැඩි වන සෑම පිටුවකටම | රු. 8.00 |

iii. නිර්මාණාත්මක අත්පිටපත් සමීක්ෂණය

| | |
|---|---|
| පිටු 1 – 150 දක්වා | රු. 1200.00 |
| පිටු 150ට වැඩි වන සෑම පිටුවකටම | රු. 7.00 |

අත් පිටපත් සාමාන්‍යයෙන් සමීක්ෂකයින් දෙදෙනකු හෝ විශේෂ අවස්ථාවල තිදෙනකු වෙත යැවෙන බැවින්, මෙම ගාස්තුවලින් ආවරණය වන්නේ සමීක්ෂණ ගාස්තුවලින් කොටසක් පමණි. ඉතිරි ප්‍රමාණය මණ්ඩලය විසින් දරනු ලැබේ.

සමීක්ෂණ ගාස්තු සඳහා වන චෙක්පත්, **සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය** යන නමට ලිවිය යුතුය. මුදලින් ගෙවන්නේ නම්, කාර්යාල වේලාවන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එම ගෙවීම්, මණ්ඩලයේ සරප් වෙත ගෙවා ලදුපතක් ලබාගත යුතුය. එසේ නොමැති නම්, දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් **මහජන බැංකුව, කොළඹ පුරහල ශාඛාවේ අංක167-1-001-6-3170315 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ** ගිණුමට බැර කරන සේ මුදල් තැන්පත් කර ලබාගත් පිළිපත අත්පිටපත සමග ඉදිරිපත් කළ යුතුය.

## 9. රහස්‍යභාවය

අත්පිටපත් සමීක්ෂණයේදී සමීක්ෂකවරයාට කර්තෘ පිළිබඳ හෝ කර්තෘට සමීක්ෂකාවරයා පිළිබඳ හෝ කිසිදු තොරතුරක් අනාවරණය කරනු නොලැබේ. මෙම රහස්‍යභාවයට බාධා කිරීම හෝ බාධා කිරීමට තැත් කිරීම අත්පිටපත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

## 10. සමීක්ෂණය

සමීක්ෂණය සඳහා සුදුසුකම් ලත් සෑම අත්පිටපතක්ම සාමාන්‍යයෙන් සමීක්ෂකයන් දෙදෙනෙකු වෙත යොමු කරනු ලැබේ. මෙම සමීක්ෂණ මණ්ඩලය අදාළ විෂය පිළිබඳ විශේෂඥතාවක් ඇති අයගෙන් සමන්විත වේ. සමීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා, ප්‍රකාශන උපදේශක කමිටුව විසින් සලකා බැලීමෙන් අනතුරුව, අදාළ අත්පිටපත පිළිගැනීම හෝ නොපිළිගැනීම පිළිබඳ තීරණය කරනු ලැබේ. සංශෝධනය කිරීමෙන් පසු නැවත සලකා බැලිය යුතුයැයි කමිටුව තීරණය කරනු ලබන අත්පිටපත්වල තත්ත්වය උසස් කිරීමට ඉටු කළ යුතු සංශෝධන සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇත්නම්, එම කොටස් උපුටා කර්තෘවරයාට දැනුම් දෙනු ලැබේ. සමීක්ෂණ වාර්තාවල සම්පූර්ණ අයිතිය මණ්ඩලය සතු වේ. අවශ්‍ය අවස්ථාවලදී ඉල්ලීම් මත අදාළ සමීක්ෂණ වාර්තාවල උධෘත පමණක් ලේඛකයා වෙත නිකුත් කරනු ලැබේ.

## 11. ප්‍රතික්ෂේප වූ අත්පිටපත්

ආධාර ලැබීම සඳහා අත්පිටපත් අනුමත කිරීම හෝ නොකිරීම, බාහිර විද්වතුන්ගෙන් සැදුම්ලත් ප්‍රකාශන උපදේශක කමිටුවේ තීරණය අවසන් තීරණය වේ. ප්‍රතික්ෂේප වූ අත්පිටපත් ලේඛකයා වෙත ආපසු එවනු ලැබේ. එම අත්පිටපත් සමීක්ෂණය සඳහා මණ්ඩලය විසින් දරන ලද අමතර සමීක්ෂණ ගාස්තු කතුවරයාගෙන් අයකරගනු නොලැබේ.

## 12. ප්‍රතික්ෂේප වූ අත්පිටපත් සඳහා අභියාචනා

ප්‍රතික්ෂේප වූ අත්පිටපත් පිළිබඳ ලේඛකයාට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එම අභියාචනය ප්‍රකාශන උපදේශක කමිටුව පිළිගන්නේ නම් මේ සඳහා රු: 1000.00 ක අභියාචනා තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය. උපදේශක කමිටුව එම අභියාචනය සලකා බලා එය පදනම් සහිතයැයි පෙනී ගියහොත්, අදාළ සමීක්ෂණ වාර්තා හා අත්පිටපත් නැවත පරීක්ෂා කිරීම සඳහා අභියාචනා අනුකමිටුවක් වෙත යොමු කරනු ලැබේ.

## 13. මුද්‍රණයේදී සපුරාලිය යුතු අවශ්‍යතා

ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය යටතේ අනුමත කරනු ලබන අත්පිටපත් මුද්‍රණය කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිති ගිවිසුම් පත්‍රයෙහි ඇතුළත් වන අතර එම ප්‍රමිති අනුගමනය කිරීම කර්තෘවරයාගේ වගකීම වේ.

i. සියලුම කෘති අවම වශයෙන් ජී. එස්. එම්. 70 නො. 01 (70 GSM No. 01) කඩදාසියේ මුද්‍රණය කළ යුතු වේ.

ii. නිර්මාණාත්මක සාහිත්‍ය කෘති හා පරිවර්තන කෘති සඳහා පොයින්ට් 11 හෝ 12 ප්‍රමාණයේ අකුරු යෙදිය යුතු අතර, පර්යේෂණාත්මක ශාස්ත්‍රීය ග්‍රන්ථ සඳහා අවශ්‍ය නම් පොයින්ට් 10 ප්‍රමාණයේ අකුරුද භාවිත කළ හැක. (ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය.)

iii. මුද්‍රිත පොත සෙක්ෂන් නූලෙන් (section binding) හෝ පර්ෆෙක්ට් (perfect binding) ක්‍රමයට බැඳ තිබිය යුතුය. පිටු 250 වැඩි පොත් අනිවාර්යයෙන් ම සෙක්ෂන් ක්‍රමයට බැඳිය යුතු වේ.

iv. ග්‍රන්ථනාම පිටුව සැකසීම හා ග්‍රන්ථයේ සැලැස්ම පිළිබඳ සම්මත ග්‍රන්ථ විද්‍යාත්මක ක්‍රම/සම්මත පිළිපැදිය යුතුය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ප්‍රකාශිත අදාළ උපදෙස් සහිත ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය නමැති ග්‍රන්ථය ජාතික පුස්තකාල පොත්හලෙන් මිලට ගැනීමට හෝ ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශයෙන් විමර්ශනය කිරීමට පහසුම් සලසා ඇත.

v. අවම වශයෙන් 230 GSM ආර්ට්බෝඩ්වලින් පිටකවරය සකස් කළ යුතුය.

vi. මුද්‍රණ දෝෂ විරහිත විය යුතුය.

vii. මුද්‍රණයට පෙර ග්‍රන්ථයේ පිටකවරය හා මුල් පිටු මණ්ඩලයට පෙන්වා අනුමත කරවා ගත යුතු වේ.

viii. ග්‍රන්ථය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මුද්‍රණාලයකින් මුද්‍රණය කොට එම මුද්‍රණාලයේ ලියාපදිංචි අංකය හා සමග අදාළ ග්‍රන්ථයේ පිටපත් 1000ක් මුද්‍රණය කළ බවට මුද්‍රණ ආයතනය මගින් ලිඛිතව තහවුරු කළ යුතුය.

## 14. ගිවිසුම හා ප්‍රකාශය

i. ව්‍යාපෘතිය යටතේ අනුමත වූ අත්පිටපත් ප්‍රකාශනයට පෙර ලේඛකයා මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

ii. එම ගිවිසුමෙන් මණ්ඩලය විසින් අනුමත කරන ලද අත්පිටපත නියමිත කොන්දේසිවලට අනුව මුද්‍රණය කරවා නියමිත දිනට පෙර අදාළ මුද්‍රිත පිටපත් මණ්ඩලය වෙත ගෙනවිත් භාරදෙන බවට ලේඛකයා ගිවිස ගත යුතුය.

iii. අදාළ කොන්දේසි අනුව මුද්‍රණය කරන ලද පොත්වලින් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණ කමිටුව විසින් තීරණය කරනු ලබන මිලට, ලබා ගන්නා බවට මෙහිදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එකඟ වේ.

iv. අනුමත වූ අත්පිටපත් ප්‍රකාශනය කිරීමේදී මණ්ඩලයෙන් ලිඛිත අවසරයක් නොමැතිව අදාළ අත්පිටපතට කිසිදු කොටසක් ඇතුළත් කිරීම හෝ අත්පිටපතෙන් කිසිදු කොටසක් ඉවත් කිරීම හෝ නොකළ යුතුය.

v. ගිවිසුමේ කොන්දේසි කුමන ආකාරයකින් හෝ කඩකිරීම ගිවිසුම අවලංගු කිරීමට හේතු වේ.

vi. මුද්‍රණ කටයුතු අවසන් වීමෙන් පසු ආදර්ශ මුද්‍රිත පිටපත් දෙකක් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහිදී අදාළ කොන්දේසිවලට අනුකූලව මුද්‍රණය කර ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ. එම ආදර්ශ මුද්‍රිත පිටපත අනුමත වීමෙන් පසු මණ්ඩලයට ලැබිය යුතු මුද්‍රිත පිටපත් භාරදිය යුතුය. මණ්ඩලයට සපයනු ලබන සියලුම මුද්‍රිත පිටපත් මණ්ඩලය වෙත කලින් ඉදිරිපත් කරන ලද ආදර්ශ මුද්‍රිත පිටපතට සෑම අතින්ම අනුකූල විය යුතුය.

vii. **ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය හරහා අනුමත වී ප්‍රකාශයට පත් කරන ලද කෘතිවල මුද්‍රිත පිටපත සමග එහි මෘදු පිටපත (Soft copy) මණ්ඩලය වෙත ලබා දිය යුතුය.**

සැ.යු. ඉහත සඳහන් කොන්දේසි සපුරා නොමැති, විශේෂයෙන් මුද්‍රණ දෝෂ සහිත කෘති, ප්‍රකාශන උපදේශක කමිටුවේ නිර්දේශය මත ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය මණ්ඩලය සතු වේ.

අධ්‍යක්ෂ ජනරාල්
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
**අංක 14, නිදහස් මාවත**
**කොළඹ 07**
**විමසීම : 011-2687583**

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
## ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය
## අයදුම් පත්‍රය

| අත්පිටපත පිළිබඳ තොරතුරු | | | |
|---|---|---|---|
| අත්පිටපතේ නම | | | |
| විෂය ක්ෂේත්‍රය | | පිටු ගණන | |

| අත්පිටපතේ අන්තර්ගතය පිළිබඳ කෙටි හැඳින්වීමක් |
|---|
| |
| |
| |
| |
| |
| |
| |
| |

මෙය අන් කවර හෝ ග්‍රන්ථයක පරිවර්තනයක් හෝ අනුවාදයක් ද? *ඔව්/නැත
පිළිතුරු 'ඔව්' නම්

| මුල් කෘතියේ නම | කර්තෘ | ප්‍රකාශක හා ප්‍රකාශන වර්ෂය |
|---|---|---|
| | | |

(අදාළ කරගත් කෘතියේ පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතු වේ)

| කර්තෘ/පරිවර්තක/අනුවාදක පිළිබඳ තොරතුරු | |
|---|---|
| කර්තෘ/පරිවර්තක/අනුවාදක | |
| පෞද්ගලික ලිපිනය | |
| දුරකතන/ෆැක්ස් අංක හා විද්‍යුත් තැපැල් ලිපිනය | |
| වෘත්තීය/තනතුර | |
| රාජකාරි ලිපිනය | |
| දුරකතන/ෆැක්ස් අංක හා විද්‍යුත් තැපැල් ලිපිනය | |

මෙම ව්‍යාපෘතිය යටතේ මීට කලින් ප්‍රකාශන අනුග්‍රහය ලැබී ඇත්නම් ඒ පිළිබඳ විස්තර පහතින් සඳහන් කරන්න.

| ග්‍රන්ථ නාමය | ආධාර ලැබූ වර්ෂ | විශේෂ සම්මාන හෝ ත්‍යාග (ඇතොත්) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**මුද්‍රණ තොරතුරු**

**මෙම තොරතුරු මුද්‍රණකරුවෙකු සමඟ සාකච්ඡා කොට නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ.**

මුද්‍රිත පිටු ගණන දළ වශයෙන් : ..........................................

අකුරුවල ප්‍රමාණය : ..........................................

මුද්‍රණ පොතේ ප්‍රමාණය : * (ක්‍රවුන් 1/8, ඩිමයි 1/8, වෙනත් ......................................)

චිත්‍ර හා රූපසටහන් : කළු-සුදු ............ වර්ණ .......... පිටු ප්‍රමාණය ............

පිටකවරයේ ඇතුළත් වර්ණ ප්‍රමාණය : ..........................................

මුද්‍රණය කිරීමට අපේක්ෂිත මුළු පිටපත් සංඛ්‍යාව: ..........................................

වෙළඳ මිල දළ වශයෙන් : රු. ......................................

ඉහත සඳහන් තොරතුරු සියල්ල නිවැරදි බවත්, මෙම අත්පිටපත මීට පෙර ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ප්‍රතික්ෂේප කළ අත්පිටපතක් නොවන බවත්, එසේ ම මෙම අත්පිටපත කවර හෝ මුද්‍රිත මාධ්‍යයක් මඟින් ප්‍රකාශනය වී නොමැති බවත් සහතික කරමි.

...............................
අත්සන

දිනය : .............................

*** (නොගැලපෙන වචන කපා හරින්න)**